# 4 සමදර්ශක ශුභාරංචි

සදලි : අම්මේ, අපේ පන්තියේ රෙබෙකා ජේසුස් වහන්සේ ගැන ලස්සන කවි පෙළක් ලියලා. ඒක ළමා ප්‍රදීපයේ පළ වෙලා. මේ බලන්න. හරි ම ලස්සනයි.

අම්මා : කොච්චර හොඳ දෙයක් ද?

සදලි : අම්මේ, මටත් ආසයි ජේසුස් වහන්සේ ගැන විස්තර දැන ගන්න. එතුමා උගන්නපු දේවල්, කතා කරපු දේවල්, රෝගීන් සුව කළ හැටි, මේවා හරියට ම දැන ගන්න ආසයි.

අම්මා : ඉතින් පුතේ, ඔයා ශුභාරංචි කියවන්න. ඒක තමයි හොඳ ම විදිහ ජේසුස් වහන්සේ ගැන දැන ගන්න.

සදලි : මට පුළුවන් වේවි ද ඉවර කරන්න.

අම්මා : ඔව් මුලින් ම සමදර්ශක ශුභාරංචි කියවන්න පටන් ගන්න.

සදලි : මොනව ද අම්මේ සමදර්ශක ශුභාරංචි කියල කියන්නේ? මම එහෙම නමක් අහලා නැහැ.

අම්මා : හොඳයි. මම කියල දෙන්නම් සමදර්ශක ශුභාරංචි මොනවා ද කියලා.

සමදර්ශක ශුභාරංචි 3කි. ඒවා නම්;

1. මතෙව් ශුභාරංචිය
2. මාක් ශුභාරංචිය
3. ලූක් ශුභාරංචිය






නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මෙම ශුභාරංචි සමදර්ශක ශුභාරංචි ලෙස හඳුන්වන්නේ ඒවා අතර සමානකම් බහුල ව ඇති නිසා ය. ජේසුස් වහන්සේ සම්බන්ධ තොරතුරු මේ සුවිශේෂක කතුවරුන් තුන්දෙනා ම දක්වන්නේ බොහෝ දුරට සමාන ආකාරයට ය.

ජේසුස් වහන්සේගේ බෞතීස්මය සමදර්ශක ශුභාරංචි කතුවරුන් තිදෙනා දකිනුයේ සමාන ආකාරයකට ය. පහත උපුටා ගැනීම් ඒ සඳහා උදාහරණ වේ.

තව ද "මොහු මාගේ ප්‍රියාදර පුත්‍රයා ය. මොහු කෙරේ මම ඉතා ප්‍රසන්න වී සිටිමි"යි ස්වර්ගයෙන් හඬක් නික්මිණි.

(මතෙව් 3:17)

තව ද ස්වර්ගයෙන් නික්මුණු හඬක්, "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය. ඔබ කෙරේ ඉතා ප්‍රසන්න වී සිටිමි"යි පැවසී ය.

(මාක් 1:11)

එවිට: "ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝ ය. ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්න වී සිටිමි"යි අහසින් හඬක් නික්මිණි.

(ලූක් 3:22)

ශුද්ධ වූ ලූක් තුමාගේ සුවිශේෂය පිළිබඳ ව අට වන ශ්‍රේණියේ දී අපි ඉගෙන ගත්තෙමු. මෙම පාඩමේ දී අපි ශුද්ධ වූ මතෙව් තුමා සහ ශුද්ධ වූ මාක් තුමා පිළිබඳ ව ඉගෙන ගනිමු.

## මතෙව් ශුභාරංචිය

**කර්තෘ :** ශුද්ධ වූ මතෙව් අපෝස්තුලුතුමා

**කාලය :** ක්‍රි.ව. 80 - 90

**අරමුණු :** - ජේසුස් වහන්සේ නව මෝසෙස් තුමා හා නව මෙසියානික ගුරුවරයාණන් බව ප්‍රකාශ කිරීමට

**මෙම ශුභාරංචිය සඳහා භාවිත වන වෙනත් නම් :**

ශුද්ධ වූ සභාවේ ශුභාරංචිය
දේව රාජ්‍යයේ ශුභාරංචිය



4.1 රූපය - ශුද්ධ වූ මතෙව් තුමා



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## මාක් ශුභාරංචිය

**කර්තෘ :** ශුද්ධ වූ මාක් තුමා

**කාලය :** ක්‍රි.ව. 64 - 66

**අරමුණ :** - රෝමයේ නීරෝ අධිරාජ්‍යයාගේ පීඩනයට ලක් වූ කිතුනුවන් දිරිමත් කිරීමට ය.



4.2 රූපය - ශුද්ධ වූ මාක් තුමා

**මෙම ශුභාරංචිය සඳහා භාවිත වන වෙනත් නම් :**
දුක්ප්‍රාප්තියේ ශුභාරංචිය

එසේ ම අප ජීවිතයට පැමිණෙන අභියෝග ඉදිරියෙහි ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දැරීමට උනන්දු වෙමු. රෝම අධිරාජ්‍යයේ පීඩන හමුවේ මාක් සංසයෙහි කිතුනුවන් විශ්වාසවන්ත ව සිටීම අපි ආදර්ශයට ගනිමු. අපේ ජීවිතවල එදිනෙදා හමුවන අභියෝගවලට විශ්වාසයෙන් පිළිතුරු දෙමු.

දෙවියන් වහන්සේ අපට දී ඇති විවිධ දක්ෂතා හා හැකියා උදෙසා අපි උන්වහන්සේට ස්තුති ප්‍රශංසා කරමු. විශේෂයෙන් ශුභාරංචි කතුවරුන් මෙන් අපේ ලේඛන හැකියා ශුභාරංචිය පතළ කිරීමට උපයෝගී කර ගනිමු.

### ක්‍රියාකාරකම

1. සමදර්ශක ශුභාරංචි නම් කරන්න.
2. මතෙව් ශුභාරංචිය සඳහා භාවිත වන වෙනත් නම් දෙකක් ලියන්න.
3. ශුද්ධ වූ මාක් තුමා ශුභාරංචිය ලියූ අරමුණ සඳහන් කරන්න.

**ජීවිතයට බිඳක්**

*අභියෝග හමුවේ ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දරමු.*



නොමිලේ බෙදාහැරීම සඳහා ය.